

එකෝමත් එක කාලෙක මහ වනාන්තරයක බොහෝ සතා සිව්පාවෝ වාසය කළා.නොයෙක් වර්ගවල කුරුල්ලෝ ද රංචු රංචු සිටියහ.

මේ අතර වටු කුරුළු රංචුවක් ඉතා සමඟියෙන් කල් ගෙවූහ.



වටු කුරුල්ලන් අල්ලන

දඩයක්කරුවෙක් ද මේ වනයේ විසුවේය.

ඔහු වනයට ගොස් වටු කුරුල්ලෙකු මෙන්

හඬක් නඟයි.අහිංසක වටු කුරුල්ලෝ

ඒ හඬට එතැනට පියඹා එති.

එවිට දඩයක්කාරයා එතැනට ගොස් දැල එළා

කුරුල්ලන් අල්ලා ගනී.

මේ කුරුළු රාජධානියේ නායකයෙක්ද විය.
තමාගේ රංචුවේ කුරුල්ලන ටිකෙන් ටික අඩු
වන බව වටු කුරුළු රජතුමාට දැනිණී.
කුරුල්ලන් බේරා ගැනීමට උපායක් ඔහු
කල්පනා කළේය.





ඔහු කුරුල්ලන් කැඳවා මෙසේ කීවේය."දඩයක්කාරයා දැල දැමූවාම හැමදෙනාම එක වගේ එකතු වෙලා එක පාරටම දැල උස්සාගෙන ඉගලෙන්න ඕනෑ.

ඈතට ගිහින් පඳුරු තියෙන තැනක් බලලා පහළට බහින්න. එතකොට දැල පඳුරු වල පැටලිලා කාටත් පරිස්සමින් ඉගිලිලා යන්ට පුළුවන්."

එක් දිනක් සුපුරුදු ලෙස දඩයක්කාරයා

කැලයට ගොස් දැල දැම්මේය.






එකා වගේ එකතු වුණාම මොනව කරන්න බැරිද?